# ශ්‍රී ලංකාවේ දුම්වැටි භාවිතය පිළිබඳ ප්‍රවණතා සමීක්ෂණය - 2024


තොරතුරු පත්‍රිකාව

මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC, Sri Lanka)

ශ්‍රී ලංකාව පුරා දුම්වැටි භාවිතයේ වර්තමාන ප්‍රවණතා අධ්‍යයනය කිරීම සඳහා මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය 1998 සිට දුම්වැටි භාවිතය පිළිබඳ ප්‍රවණතා සමීක්ෂණ පවත්වයි. 2024 වර්ෂයේදී කොළඹ, කළුතර, ගාල්ල, පුත්තලම, යාපනය, වවුනියාව, අනුරාධපුර, අම්පාර, මාතලේ, කෑගල්ල සහ බදුල්ල යන දිස්ත්‍රික්ක එකොළහක් පුරා විහිදී ගිය අධ්‍යයනයක් ලෙස මෙම සමීක්ෂණය සිදු කරන ලදී. තෝරාගත් දිස්ත්‍රික්ක තුළ ජීවත් වන වයස අවුරුදු 15 සහ ඊට වැඩි පිරිමි ජනගහනය සමීක්ෂණයට ඇතුළත් කරගන්නා ලදී. පුහුණු පර්යේෂකයන් විසින් වලංගු ප්‍රශ්නාවලියක් භාවිත කරමින් දත්ත රැස් කරන ලද අතර පරීක්ෂණයට සහභාගී වූවන්ගේ ජනවිකාශන තොරතුරු, දුම්වැටි භාවිතය සඳහා සෘජුවම බලපෑ සමකාලීන ගැටලු සහ දුම්වැටි භාවිතයේ රටාවන් පිළිබඳ තොරතුරු සමීක්ෂණයේදී ලබා ගන්නා ලදී.

**සමීක්ෂණයට සහභාගි වූ සියලු දෙනා අතරින් දුම්වැටි භාවිත කරන්නන් (වයස අවුරුදු 15 සහ ඊට වැඩි)**

(සමීක්ෂණය පවත්වන අවස්ථාවේ පසුගිය දින 30 තුළ දුම්වැටි භාවිත කළ පුද්ගලයින්).



21.6%

**සමීක්ෂණය පවත්වන අවස්ථාවේ පසුගිය දින 30 තුළ දුම්වැටි භාවිත කළ වයස අවුරුදු 15ත් 21ත් අතර ප්‍රතිශතය** 11.6%

බාලවයස්කාර දරුවන් අතර දුම්වැටි භාවිතය වැළැක්වීම සඳහා පහත සඳහන් පියවර ඉතා වැදගත් වේ.

- NATA පනත මගින් විශේෂයෙන්ම බාල වයස්කරුවන්ට දුම්වැටි විකිණීම තහනම් කර ඇතත්, එම නීතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය වේ.
- සාම්ප්‍රදායික හා සමාජ මාධ්‍ය හරහා ළමුන් ඉලක්ක කර ගනිමින් සිදු කරන සෘජු හා සියුම් ප්‍රවර්ධනයන් තහනම් කිරීම සඳහා පවතින නීතිය තදින් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය යෝජනා කරන ලද "දුම්කොළ වලින් නිදහස් වූ පරපුරක්" යන සංකල්පය යටතේ වසර 2010න් පසු උපන් සියලු දරුවන් සඳහා දුම්කොළ නිෂ්පාදන තහනම් කිරීම.
- පහසුවෙන් අඩු මිලකට ලබා ගැනීමේ හැකියාව ලබාදෙන තනි සිගරට් අලෙවිය තහනම් කිරීම
- අධ්‍යාපන ආයතන වල සිට මීටර 100ක් ඇතුළත දුම්වැටි අලෙවිය තහනම් කිරීම.
- දුම්කොළ කර්මාන්තයේ උපක්‍රම හෙළි කිරීමටත් දුම්වැටි භාවිතය නිශ්ඵල සහ හානිකර හැසිරීමක් ලෙස අවධාරණය කිරීමටත් ජාතික මට්ටමේ නිවාරණ වැඩසටහන් හඳුන්වා දී ඒවා ක්‍රියාත්මක කිරීම.

**දුම්වැටි භාවිතය ආරම්භ කිරීම බොහෝ විට සිදුව ඇත්තේ පුද්ගලයන් එක් රැස්වූ ස්ථාන වලදීය.**

මීට සමාන සමීක්ෂණ වලින් හෙළි වී ඇත්තේ සම වයසේ මිතුරන්ගෙන් ඇතිවන පීඩනය සහ බලපෑම මෙම හැසිරීමට බලපාන ප්‍රධාන සාධකයක් බවයි.

දුම්කොළ කර්මාන්තය විසින් ඔවුන්ගේ නිෂ්පාදන පිළිබඳ ධනාත්මක ප්‍රතිරූපයක් ගොඩනැගීම අරමුණු කරගනිමින් විවිධ මාධ්‍ය සහ වෙනත් ක්‍රමවේදයන් හරහා සිදු කරනු ලබන ප්‍රවර්ධනයන්ද මෙම හැසිරීම මෙහෙයවන ප්‍රධාන නිර්ණායක වේ.

එබැවින් දුම්වැටි භාවිතයට යොමුවූවන් ඉන් මුදවා ගැනීමටත්, අවධානමට ලක්විය හැකි කණ්ඩායම් දුම්වැටි භාවිතයට යොමුවීම වළක්වා ගැනීමටත්, ප්‍රජාව තුළ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම හා දුම්කොළ පාලන ප්‍රතිපත්ති සම්පාදනය අතිශයින්ම වැදගත් වේ.

**සමීක්ෂණය අතරතුර, වයස් කාණ්ඩ තුනේම සහභාගී වූවන්ගෙන් සමීක්ෂණයට පෙර මාස හය තුළ ඔවුන්ගේ දුම්වැටි භාවිත රටාව වෙනස් කිරීමට හේතු වූ කරුණු පිළිබඳව විමසන ලදී.**

දුම්වැටි භාවිතය නිෂ්ඵල හැසිරීමක් ලෙස වටහා ගැනීම සහ මිල වෙනස්වීම් බහුතරයක් විසින් දුම්වැටි භාවිතය නතර කිරීමට/අඩු කිරීමට හේතු ලෙස දක්වා ඇති අතර, මූල්‍ය ගැටළු සහ පවුලෙන් ඇතිවන බලපෑම ද දුම්වැටි භාවිතයේ වෙනසට තුඩු දුන් හේතු ලෙස වාර්තා විය.

**සමීක්ෂණය පවත්වන අවස්ථාවේදී ඊට සහභාගී වූවන්ගෙන් සැළකිය යුතු ප්‍රමාණයක් (36.5%) දුම්වැටි භාවිතය නතර කිරීමට සමත්ව තිබූ අතර දැනට දුම්වැටි භාවිත කරන්නන්ගෙන් 20.9%ක් සමීක්ෂණය සිදු කරන කාල සීමාව තුළ ඔවුන්ගේ දුම්වැටි භාවිතය අවම කර ඇත.**

**මහ බැංකු දත්ත හා සංඛ්‍යා ලේඛන වලට අනුව, වර්ෂ 2023 දී සිගරට් සඳහා වන සුරාබදු 20%කින් වැඩි කිරීම හේතුවෙන් රජයේ ආදායම රුපියල් බිලියන 7.7කින් වැඩි වීමට හේතු වූ අතර, සිගරට් නිෂ්පාදනය මිලියන 521.5කින් අඩු වී ඇත. මෙය පෙර වර්ෂයට සාපේක්ෂව සිගරට් නිෂ්පාදනයේ 18%ක සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් කරයි.**

ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) විසින් නිර්දේශ කර ඇති පරිදි බදු සහ මිල වැඩි කිරීම්, දුම්කොළ නිෂ්පාදන වලින් සිදුවන හානිය අවම කිරීම සඳහා වන ප්‍රත්‍යක්ෂ උපායමාර්ගයක් වන අතර, එමගින් පුද්ගලයන්ට දුම්වැටි මිලදී ගැනීමේ හැකියාව අවම වන අතර දිගු කාලීන වශයෙන් ගත් කල දුම්වැටි භාවිතය අවම වීමට හේතු වේ. දුම්කොළ පාලනය සඳහා වන ලෝක සෞඛ්‍ය සංවිධාන ප්‍රතිපත්ති රාමුවේ (FCTC) 6 වැනි වගන්තිය මගින්ද දුම්කොළ නිෂ්පාදන සඳහා වන ඉල්ලුම අවම කිරීම සඳහා ඵලදායී උපක්‍රමයක් ලෙස බදු සහ මිලකරණ ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට විශේෂයෙන් දිරිමත් කරයි.

මෙම සමීක්ෂණයෙන් ලැබුණු ප්‍රතිඵල මගින් තවදුරටත් ශ්‍රී ලංකාව තුල දුම්කොළ පාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු කෙරෙන අතර, දුම්වැටි භාවිතයට යොමුවීම වැළැක්වීම අරමුනු කරගත් මැදිහත්වීම් වල අවශ්‍යතාවයද අවධාරනය කෙරේ. තවද, දුම්කොළ වලින් නිදහස් වූ පරපුරක් යන සංකල්පය යටතේ වසර 2010න් පසු උපන් සියලු දරුවන් සඳහා දුම්කොළ නිශ්පාදන තහනම් කිරීම, තනි සිගරට් අලෙවිය තහනම් කිරීම, අධ්‍යාපන ආයතනයක සිට මීටර් 100ක් ඇතුලත දුම්වැටි අලෙවිය තහනම් කිරීම ආදී නිර්දේශයන් වටා සංවාදයක් ගොඩනැගීම මෙම සමීක්ෂණයේ අරමුණයි.